**වර්ගය:** අනිවාර්ය

**පාඨමාලා සංකේතය:** CHCU E3015

**මාතෘකාව:** **හෙබ්‍රෙව් ශුද්ධ ලියවිලි සහ ක්‍රිස්තියානි ශුද්ධ ලියවිලි**

**පූර්ව අවශ්‍යතා:** දෙවන ස්තරයේ CHCU විභාග සම්පූර්ණ කර තිබීම.

**අරමුණු සහ අභිප්‍රේතාර්ථ:** මෙම විෂය ඒකකයේ ප්‍රධාන අභිප්‍රේතාර්ථය ක්‍රිස්තියානි ජනතාව විසින් ශුද්ධවත් ලෙස සලකනු ලබන සාහිත්‍යය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් ඉදිරිපත් කිරීම.

**ඉගෙනුම් ඵල:** විද්‍යාර්ථීන් ඓතිහාසික විග්‍රහාත්මක සහ වෘත්තාන්ත විමර්ශනාත්මක අර්ථ නිරූපණය හදාරනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය:**

1.**පංච පුස්තකය**ඃ පංච පුස්තකය හැඳින්වීම, යාවේ, එලොහීම්, පූජක සහ ද්විතීය නිති සම්ප්‍රදායයන් පිළිබඳ විශේෂ දැනුමක්.

2.**මැවීමේ කථා**ඃ උත්පත්ති 1:1 - 2:4 සහ සිව්වෙනි දින සහ හත්වෙනි දිනවල විශේෂත්වය;උත්පත්ති 2:4 - 3:24හි සඳහන් හොඳ-නරක අවබෝධ කිරීමේ ගසෙහි අරුත, සහභාගිත්වයේ සංකල්පය සහ සර්පයා සහ භූමිය/දූවිල්ල යන සංකේතඃ මැවීම සහ පරිණාම වාදය.

3.**නික්මයාම 1-15 පරිච්ඡේද** (නික්මයාම හා සබැඳි සිදුවීම්) සහ **නික්මයාම 19-34 පරිච්ඡේද** (සීනායිගිවිසුම)ඃ පහත සඳහන් තේමා පිළිබඳ විශේෂ දැනුමක් අපේක්ෂා කෙරේඃ මෝසෙස්ගේ උපත, ද්විත්ව අනන්‍යතාව, කැඳවනු ලැබීම, වසංගත, රතු මුහුදතරණය, ගිවිසුම, දස පනත සහ රන්වස්සා.

4. **දිවැසිවරුඃ**(අ) ඊශ්‍රායෙලයේ දිවැසිවරු පිළිබඳ මූලික දැනුමක්, දිවැසිවරුන් හඳුන්වනු ලබන ග්‍රීක සහ හෙබ්‍රෙව් යෙදුම්, අසල්වැසි ජාතීන්ගේ දිවැසිවරු, ඊශ්‍රායෙලයේ දිවැසිවරය පිළිබඳලියවිලි සහ දිවැසිවරුන් ක්‍රියාත්මක වූ තෙවැදෑරුම් ඉතිහාසය.

(ආ)ආර්ථිකය, දේශපාලන බලය, අධිකරණය සහ සමය යන ක්ෂේත්‍රයන්හි සාධාරණත්වය සහ අසාධාරණත්වය පිළිබඳ දිවැසිවර සංකල්පය.

(ඇ)ආමොස්, හොසියා, යෙසායා, ජෙරමියා,එසකියෙල් සහ දෙවන යෙසායා යන දිවැසිවරුන්ගේ ජීවන තොරතුරු, ඔවුන්ගේ කෘති සහ දැක්ම

**5.සමදර්ශක ශුභාරංචි සහ ක්‍රියා පොත**:"ශුභාරංචි"ශෛලියේ මූලාරම්භය, ශුභාරංචි සැකසුණු ත්‍රිවිධ පියවර,සමදර්ශක ශුභාරංචි සැකසීම පිළිබඳ විද්වත් මත. ලූක් ශුභාරංචියේ මූලාශ්‍රයයන් සහ කර්තෘත්වය, ආශ්‍රිත ප්‍රජාව සහ ලියවුණු කාලයඃ ලූක් ශුභාරංචියේ ප්‍රධාන තේමා. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි මූලාශ්‍රයයන් සහ කර්තෘත්වය, ආශ්‍රිත ප්‍රජාව සහ ලියවුණු කාලයඃ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ප්‍රධාන තේමා.

**6.පාවුලු සාහිත්‍යයඃ** නව ගිවිසුමේ "ලිපි" වර්ගීකරණයඃ පාවුලුතුමාගේ ජීවිතය සහ චින්තනය. රෝම ලිපිය (ලිපියේ පසුබිම සහ ප්‍රධාන තේමා)

**7.ජොහාන් සාහිත්‍යයඃ** ජොහාන් ශුභාරංචියේ මූලාශ්‍රයයන් සහ කර්තෘත්වය, ආශ්‍රිත ප්‍රජාව සහ ලියවුණු කාලය, ජොහාන් ශුභාරංචිය සහ සමදර්ශක ශුභාරංචිය අතර සංසන්දනාත්මක අධ්‍යයනයක්. හැඳින්වීම (Prologue) (1:118)"ප්‍රේමවන්ත ශ්‍රාවකයා"පිළිබඳ කොටස් සහ දුක් විඳීමේ කථාව (18-19)පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්. එළිදරව් පොතෙහි මූලාශ්‍රයයන් සහ කර්තෘත්වය, ආශ්‍රිත ප්‍රජාව සහ ලියවුණු කාලය, එළිදරව් පොතේ ප්‍රධාන තේමා.

**ක්‍රමවේදය:** දේශන, සාකච්ඡා සහ ප්‍රස්තුතීකරණ

**ඇගයීමේ ක්‍රමය:** වර්ෂාවසාන පරීක්ෂණය

**නිර්දේශිත කියවීම්ඃ**


Beale, G.K. (1999). *The Book of Revelation*. Grand Rapids, Cambridge.

Brown, R.E. (1979). *The Community of the Beloved Disciple*. Paulist Press, NY.

Brown, R.E. (1966-1970). *TheGospel According to John*(Vols. I – II). AB 29, 29a, Doubleday, NY.

Dunn, J.D.G. (1998). The *Theology of Paul the Apostle*. Eerdmans, Grand Rapids, MI – Cambridge.

Gundry, R.H. (1994).*Matthew. A Commentary on His Handbook for a Mixed Church*

*underPersecution*. Eerdmans, Michigan.

Fitzmyer, J.A. (1998).*The Acts of the Apostles*. AB 28a, Doubleday, NY.

Fitzmyer, J.A. (1993).*Romans. A New Translation with Introduction and Commentary*. AB 33, Doubleday, NY.

Moloney, F.J. (1998).*The Gospel of John*.Minnesota: Sacra Pagina, The Liturgical Press.

Soggin, J.A. (1989), *Introduction to the Old Testament*, OTL, Wesstminister/John Knox, Kentucky.

සිල්වා, එච්. (1991).*එළිදරව්වේ ශුභාරංචිය*-දේව ධර්ම නිකේතන ප්‍රකාශන 9. කොළඹ.

විජේසිංහ, එස්.එල්. (2000).*ඊශ්‍රායෙලයේ දිවැසිවරු*, සාවනා 1, සමාජය සහ සාමයික කේන්ද්‍රය, කොළඹ.

විජේසිංහ, එස්.එල්. (2002).*දිවැසිවරු සහ සාධාරණත්වය*, සාවනා 5, සමාජය සහ සාමයික කේන්ද්‍රය, කොළඹ.

විජේසිංහ, එස්.එල්. (2006). "ගිනිගෙන නොදැවෙන පඳුර", නික්මයාම 3,1-4,17 වෘත්තාන්ත විමර්ශනය, *දහම් දියඹ* 8, 51-60.

විජේසිංහ, එස්.එල්. (2006). "නික්මයාම 1-2 වෘත්තාන්ත විමර්ශනය", *දහම් දියඹ* 8, 43-50.

විජේසිංහ, එස්.එල්. (2006). "නික්මයාම 19 වෘත්තාන්ත විමර්ශනය", *දහම් දියඹ* 8, 61-72.

විජේසිංහ, එස්.එල්. (2001). "පීඩක පීඩිත භාවයේ සුලමුල", *ජන දෙවිදහමක් සඳහා බයිබලීය සංකේත*, සාවනා 4, සමාජය සහ සාමයික කේන්ද්‍රය, කොළඹ, 1-24.

විජේසිංහ, එස්.එල්. (2006). "රන් වසු පිළිමය. නික්මයාම 32-34 වෘත්තාන්ත විමර්ශනය", *දහම් දියඹ*8, 73-80.